රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

***2018.04.11***

*ප්‍රවෘත්ති නිවේදනය*

***<u>අලුත් අවුරුදු උත්සව සමය වෙනුවෙන් විශේෂ දුම්රිය ධාවනය කිරීම</u>***

අලුත් අවුරුදු උත්සව සමය වෙනුවෙන් මගී ජනතාවගේ පහසුව සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විශේෂ දුම්රිය සේවාවක් පවත්වාගෙන යාමට කටයුතු යොදා ඇත.

ඒ අනුව 2018.04.12 දින (හෙට) විශේෂ දුම්රිය 12 ක් ධාවනය කෙරෙනු ඇත. ඒ අනුව ප.ව. 7.20 ට කොළඹ කොටුව සිට බණ්ඩාරවෙල දක්වා වායු සමනය කළ මැදිරියක් සහිත දුම්රියක් ධාවනය වේ. එමෙන්ම ප.ව.10.00 ට කොළඹ කොටුව සිට යාපනය දක්වාත්, ප.ව.6.50 ට කොළඹ කොටුව සිට ගාල්ල දක්වාත් දුම්රිය 02 ක් ධාවනය කෙරේ.

තවද ප.ව.1.05 ට කොළඹ කොටුවේ සිට මහව සංධිය දක්වාත්, ප.ව.5.10 ට මහව සංධියේ සිට කොළඹ කොටුව දක්වාත් විශේෂ දුම්රිය 02 ක් ධාවනය කිරීමට නියමිතයි. මරදාන සිට ගාල්ල දක්වා විශේෂ දුම්රිය 02 ක් පෙ.ව.9.20 ට සහ පෙ.ව.11.50 ට ධාවනය වන අතර ප.ව.9.30 ට ගාල්ල සිට මරදාන දක්වා දුම්රියක් ධාවනය වනු ඇත.

මීට අමතරව ප.ව.7.00 ට මාතර සිට මරදාන දක්වාත්, ප.ව.2.55 ට මරදාන සිට මාතර දක්වාත් දුම්රිය 02 ක් ධාවනය වේ. එමෙන්ම ප.ව.1.15 ට සහ ප.ව.5.55 ට ගාල්ල දුම්රිය ස්ථානයේ සිට කොළඹ කොටුව දක්වා දුම්රිය 02 ක් ධාවනය කෙරෙනු ඇත.

මීට අමතරව අලුත් අවුරුදු විශේෂ සේවා වෙනුවෙන් ඉදිරි දිනවල ක්‍රියාත්මක කෙරෙන දුම්රිය ධාවන සැලසුම පහත දක්වා තිබේ.

| දිනය | ආරම්භක ස්ථානය | අවසන් ස්ථානය | වේලාව | පහසුකම් |
|---|---|---|---|---|
| 2018/04/13 | බණ්ඩාරවෙල | කොළඹ කොටුව | පෙ.ව 08.05 | වායු සමනය කල මැදිරියක් සහිතය |
| | මරදාන | ගාල්ල | පෙ.ව 9.20<br>පෙ.ව 11.50 | |
| | ගාල්ල | කොළඹ කොටුව | ප.ව. 1.15<br>ප.ව. 05.55 | |
| 2018/04/14 | කොළඹ කොටුව | වේයන්ගොඩ | පෙ.ව 8.00 | |
| | වේයන්ගොඩ | කළුතර දකුණ | පෙ.ව 9.30 | |
| | වේයන්ගොඩ | කොළඹ කොටුව | ප.ව 4.00 | |
| | මරදාන | කළුතර දකුණ | පෙ.ව7.40 | |
| | කළුතර දකුණ | වේයන්ගොඩ | ප.ව 1.00<br>පෙ.ව 9.20 | |
| | වේයන්ගොඩ | කළුතර දකුණ | පෙ.ව12.25 | |
| | කළුතර දකුණ | මරදාන | ප.ව 3.20 | |
| 2018/04/15 | කොළඹ කොටුව | බණ්ඩාරවෙල | ප.ව 07.20 | වායු සමනය කල මැදිරියක් සහිතය |
| | මාතර | මරදාන | ප.ව 7.00 | |
| | මරදාන | මාතර | ප.ව 2.55 | |
| | යාපනය | කොළඹ කොටුව | ප.ව 8.00 | |

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව · දු. தொ. t. (+94 11) 2515759 · www.news.lk

| | | | | |
|---|---|---|---|---|
| 2018/04/16 | බණ්ඩාරවෙල | කොළඹ කොටුව | පෙ.ව 08.05 | වායු සමනය කල මැදිරියක් සහිතය |
| | මාතර | මරදාන | ප.ව 7.00 | |
| | කොළඹ කොටුව | ගාල්ල | ප.ව 6.50 | |
| | මරදාන | මාතර | ප.ව 2.55 | |
| 2018/04/17 | මරදාන | ගාල්ල | පෙ.ව 9.20<br>පෙ.ව 11.50 | |
| | ගාල්ල | මරදාන | පෙ.ව 07.05 | |
| | ගාල්ල | කොළඹ කොටුව | ප.ව. 1.15<br>ප.ව. 05.55 | |

අලුත් අවුරුදු සමය වෙනුවෙන් ඉදිරි දින කිහිපය තුළදීත් විශේෂ දුම්රිය සේවාවන් ක්‍රියාත්මක වන බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව දන්වා සිටියි.

එල්.පී.තිලකරත්න
අංශ ප්‍රධානී (ප්‍රචාරක)
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට